**ශීර්ෂය 271 - ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 271 - ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකිම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරිම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) විගණනය වෙත ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ අනුරූපී වී තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) මූලධන වියදම්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ (ACA-F) ප්‍රාග්ධන වියදම් එකතුව රු.62,795,088 ක් විය. එම මුදල සමාලෝචිත වර්ෂය තුළ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය යටතේ දක්වා නොතිබූ අතර මෙහෙයුම් ක්‍රියාකාරකම් තුල වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් යටතේ දක්වා තිබුණි. | විගණනයෙන් නිරීක්ෂණය කළ වෙනස වූ රු.62,795,087 මුදල 2023 වසරේ දරන ලද ප්‍රාග්ධන වියදමකි. කෙසේ වෙතත්, 2023 මූල්‍ය ප්‍රකාශනයේ අනෙකුත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදමට එය වැරදි ලෙස ඇතුළත් කර තිබුණි. මින් ඉදිරියට එවැනි වැරදි සිදු නොවන බව කරුණාවෙන් සලකන්න. | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය යටතේ ඇතුළත් කල යුතුය. |

(ආ) දේපළ පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (i) මූල්‍ය නොවන වත්කම් කේත 04 ක ආරම්භක ශේෂයන්හි එකතුව භාණ්ඩාගාර මුද්‍රිතය අනුව (SA 80) රු.3,930,408,810 ක්ද, සමුච්චිත මූල්‍ය නොවන වත්කම් ගිණුම් වාර්තාව අනුව (SA-82) රු.5,515,201,207ක්ද විය. ඒ අනුව | SA 80 හි දක්වා ඇති පරිදි ජංගම-නොවන වත්කම්වල ආරම්භක ශේෂය, 2023 දී අත්පත් කරගත් මූල්‍ය නොවන වත්කම් නිසි පරිදි CIGAS වෙත එකතු නොකිරීම හේතුවෙන් | ගිණුම් කටයුතු සඳහා පාදක කර ගන්නා මූලාශ්‍ර ලේඛන නිසි පරිදි යාවත්කාලීන කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ඉහත ප්‍රකාශ දෙක අතර ආරම්භක ශේෂයන්හි රු.1,584,792,397 ක වෙනසක් පැවතුණි. | නිවැරදිව දක්වා නොතිබෙනු ඇත. මින් ඉදිරියට මෙවැනි වැරදි සිදු නොවන බව කරුණාවෙන් සලකන්න. | |
| (ii) | භාණ්ඩාගාර මුද්‍රිත අංක SA 80 අනුව 271 ශීර්ෂයට අදාළව සමාලෝචිත වර්ෂය තුළ මූල්‍ය නොවන වත්කම් අත්පත් කර ගැනීමේ (මාරු කිරීම සහ මිලදී ගැනීම) මුළු වටිනාකම රු.1,587,751,879 ක් වුවද, සමුච්චිත මූල්‍ය නොවන වත්කම් ගිණුම් වාර්තාවට (SA-82) අනුව මූල්‍ය නොවන වත්කම් මිලදී ගැනීම් රු.3,976,792 ක් විය. ඒ අනුව එම ප්‍රකාශ දෙක අතර රු.1,583,775,087 ක වෙනසක් පැවතුණි. | ඇතැම් ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් CIGAS පද්ධතිය වසර තුළ අවශ්‍ය පරිදි යාවත්කාලීන කර නොමැතිකම නිසා එවැනි වෙනසක් සිදු වී ඇත. මින් ඉදිරියට එම වරද සිදු නොවන බවට කාරුණිකව දන්වමි. | ගිණුම් කටයුතු සඳහා පාදක කර ගන්නා මූලාශ්‍ර ලේඛන නිසි පරිදි යාවත්කාලීන කල යුතුය. |
| (iii) | ශීර්ෂ අංක 271ට අදාළව සමාලෝචිත වර්ෂය තුළ මූල්‍ය නොවන වත්කම් අපහරණය කිරීම්වල මුළු වටිනාකම භාණ්ඩාගාර මුද්‍රිත අංක SA 80 අනුව රු.987,770ක් වුවද, සමුච්චිත මූල්‍ය නොවන වත්කම් ගිණුම් වාර්තාව (SA-82) අනුව එම වටිනාකම රු.1,400,467 ක් විය. ඒ අනුව එම ප්‍රකාශ දෙක අතර රු.412,697 ක වෙනසක් පැවතුණි. | CIGAS විෂය භාර නිලධාරිනිය විෂයට නවක බැවින් මූල්‍ය නොවන වත්කම්වල බැහැර කිරීමේ වටිනාකම සමුච්චිත මූල්‍ය නොවන වත්කම් ගිණුමේ වැරදි ලෙස පෙන්වා දී ඇත. මින් ඉදිරියට එම වරද සිදු නොවන බවට කාරුණිකව දන්වමි. | නවක නිලධාරීන් පුහුණු කිරීම හා ගිණුම් කටයුතු නිසි පරිදි අධීක්ෂණය කිරීම සිදු කල යුතුය. |
| (iv) | භාණ්ඩාගාර මුද්‍රිත අංක SA 80 අනුව රු.1,587,751,879 ක් වූ මූල්‍ය නොවන වත්කම් මිලදී ගැනීම් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය කරන ලද මුදල් ප්‍රවාහයන් යටතේ දක්වා නොතිබුණි. | SA 80 හි දක්වා ඇති පරිදි ජංගම-නොවන වත්කම්වල ආරම්භක ශේෂය, 2023 දී අත්පත් කරගත් මූල්‍ය නොවන වත්කම් නිසි පරිදි CIGAS වෙත එකතු කර නොතිබුණි. | මූලාශ්‍ර ලේඛන නිසි පරිදි යාවත්කාලීන කල යුතුය. |

(ඇ) අග්‍රිම ශේෂය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | අග්‍රිම ගැළපුම් ප්‍රකාශය (ACA-07) අනුව, වෙනත් ආයතන වෙනුවෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගින් සිදු කරන ලද වියදම රු.2,071,574,243ක් වුවද, මුදල් ප්‍රවාහ ප්‍රකාශය (ACA-C) අනුව එම ශේෂය රු.2,134,369,330ක් විය. ඒ අනුව ඉහත ප්‍රකාශනයන් දෙක අතර රු.62,795,087 ක වෙනසක් පැවතුණි. | විගණනයෙන් නිරීක්ෂණය කළ වෙනස වූ රු.62,795,087 මුදල 2023 වසරේ දරන ලද ප්‍රාග්ධන වියදමකි. කෙසේ වෙතත්, 2023 මූල්‍ය ප්‍රකාශනයේ අනෙකුත් වැය ශිර්ෂ වෙනුවෙන් දරන ලද වියදමට එය වැරදි ලෙස ඇතුළත් කර තිබුණි. මින් ඉදිරියට එවැනි වැරදි සිදු නොවන බව කරුණාවෙන් සලකන්න. | ලේඛන අතර ශේෂයන්හි නිරවද්‍යතාවය පැවතිය යුතුය. |
| (ii) | අනෙකුත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු මගින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙනුවෙන් දරන ලද වියදම රු.2,071,569,017 ක් වුවද, මුදල් ප්‍රවාහ ප්‍රකාශය (ACA-C) අනුව රු.2,134,369,330 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සකස් කරන ලද අනෙකුත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වියදම් උපලේඛණ සමග සැසදීමේදී මුදල් ප්‍රවාහ ප්‍රකාශය අනුව රු.62,800,313 ක වෙනසක් පැවතුණි. | නිරවුල් නොකර හිගව පැවති මුදල 2022 මූල්‍ය ප්‍රකාශනයේ පාලන සාරාංශයට ඇතුළත් කර නොතිබූ මුතුර් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සංශෝධිත සාරාංශයට අයත් රු.5,225 ක් වේ. වෙනස නිරවුල් කිරීමට කටයුතු කර ඇති බව කරුණාවෙන් සලකන්න. | නිවැරදි තොරතුරු ගිණුම් ප්‍රකාශන තුලින් ඉදිරිපත් කල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 හා 2020 ඔක්තෝබර් 16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට අදාලව නිලධාරීන් විසින් හැදෑරිය යුතු සිංහල හා දෙමළ භාෂා පාඨමාලාවන් සඳහා සහභාගී වීම වෙනුවෙන් ගමන් වියදම් හා සංයුක්ත දීමනා ගෙවීමට | අදාළ ගෙවීම් පිළිබඳව විමසීමක් කර ඇත. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | නොහැකි වුවත් සමාලෝචිත වර්ෂය තුල මොරවැව හා කින්නියා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වල නිලධාරීන් 33 දෙනෙකුට මුළු වටිනාකම රු.514,483 ක් ගමන් වියදම් හා සංයුක්ත දීමනා ගෙවා තිබුණි. | | |
| (ආ) | මොරවැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මහජන රුදවුම්හලක් ඉදිකිරීම වෙනුවෙන් රු.46,175 ක වටිනාකමින් යුත්, චෙක්පතක් සහකාර ප්‍රාදේශීය ලේකම් නමින් 2023 නොවැම්බර් 30 දින නිකුත් කරන තිබුණි. 2024 මාර්තු 26 වන විටදීද චෙක්පත අත රඳවාගෙන තිබූ අතර මෙම රුදවුම්හලේ ඉදිකිරීම් කටයුතු ඒ වන විටත් අවසන් කර නොතිබිණි. සුළු ඉදිකිරීම් කටයුත්තක් වෙනුවෙන් මිනිස් දින 21 සඳහා දිනකට රු.2,200 බැගින් මුළු පිරිවැය රු.46,175ක් කම්කරු කුලී ලෙස චෙක්පතක් මඟින් මුදල් වෙන්කර තිබූ නමුත් එම චෙක්පත කොන්ත්‍රාත්කරු හෝ කම්කරුවා නමින් නිකුත් නොකර සහකාර ප්‍රාදේශීය ලේකම් නමින් නිකුත් කර තිබුණි. | මෙම රුදවුම්හලේ ඉදිකිරීම් කටයුතු වර්ෂාව නිසා ප්‍රමාද වීමක් සිදුව ඇත. 2023 වර්ෂයේ ගිණුම් පියවීමට ප්‍රථම වැඩ අවසන් කර නොතිබිම නිසා චෙක්පත රඳවාගෙන ඇත. මිනිස් දින ගණනය කිරීමේ අඩුපාඩුව කාර්මික නිලධාරිගේ මැදිහත්වීමෙන් ගෙවීම් කිරීමට පෙර නිවැරදි කර ඇත. | රාජ්‍ය මුදල් නිසි කළමනාකරණයකින් හා අධීක්ෂණයකින් යුතුව භාවිත කල යුතුය. |

## 2.2 වැඩිපුර ගෙවීම්

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ග්‍රාමීය මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය - 2021 සඳහා වූ ගෙවීම් සිදුකිරිමේදි වෙරුගල් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තාක්ෂණික නිලධාරී විසින් සකස්කර නියෝජ්‍ය ක්‍රම සම්පාදන අධ්‍යක්ෂවරයා මඟින් නිර්දේශ කළ කාර්යයන් 11ක් සඳහා සිදුකළ වැඩ වාර්තාව අනුව, නිම කල වැඩ වල අගය රු.2,575,900 ක්වූ නමුත්, කොන්ත්‍රාත්කරුට රු.5,541,835 ක් ගෙවා තිබුණි. | ග්‍රාමීය මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය - 2021 සඳහා වූ ගෙවීම් සිදු කිරිමේදි වෙරුගල් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තාක්ෂණික නිලධාරී විසින් සකස්කර නියෝජ්‍ය ක්‍රමසම්පාදන අධ්‍යක්ෂවරයා මඟින් නිර්දේශ කළ කාර්යයන් 11ක් සඳහා සිදුකළ වැඩ වාර්තා සහතික කිරීමෙන් පසුව ගෙවීම් සිදු කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි. | වැඩිපුර ගෙවීම් ආපසු අයකරගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (අ) | මොරවැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නව කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීමේ I අදියරයේදී BOQ අයිතම 12 ක් සඳහා රු.මිලියන 2.5 ක් ඇස්තමේන්තු කර තිබූ නමුත්, BOQ අයිතම හයක් සඳහා ගෙවන ලද මුදල 2023 මැයි මාසයේදී ප්‍රකාශයට පත් කරන ලද දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ BSR අනුපාතය ඉක්මවා ගොස් තිබුණි. මේ අනුව රු.178,171 ක වැඩිපුර ගෙවීමක් සිදු කර තිබුණි. මොරවැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නව කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීමේ I අදියරයේදී BOQ අයිතම 12 ක් සඳහා රු.මිලියන 2.5 ක් ඇස්තමේන්තු කර තිබූ නමුත්, 2023 මැයි මාසයේදී ප්‍රකාශයට පත් කරන ලද දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ BSR අනුපාතය ඉක්මවා ගොස් වැඩිපුර ගෙවීමක් සිදු ව ඇත. නිසි සැලසුමකින් සහ කළමනාකරණයකින් යුතුව රාජ්‍ය මුදල් ගෙවීම සඳහා භාවිතා කල යුතුය. | වැඩිපුර ගෙවීමක් සිදුව ඇත. | වැඩිපුර ගෙවීම් ආපසු අයකරගත යුතුය. |

## 2.3 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගර්භනී මව්වරුන් සඳහා පෝෂණ මල්ල දීමනාව ලබා දීම සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වෙරුගල් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට 2023 ජනවාරි සිට සැප්තැම්බර් මස දක්වා ගෙවීම් කටයුතු සඳහා රු.6,196,500ක ප්‍රතිපාදන ලබා දී තිබූ නමුත්, රු.5,292,000ක ප්‍රතිපාදන උපයෝජනය නොකොට රඳවා තබාගෙන තිබුණි. | සැපයුම්කරුවන් සොයා ගැනීමේ දැඩි අපහසුතාව නිසා ප්‍රතිපාදන උපයෝජනය නොකොට රඳවා ගැනීමට සිදුවී ඇත. | ප්‍රතිපාදන ගර්භණී මව්වරුන් සඳහා උපයෝජනය වන ආකාරයට කටයුතු සැලසුම් කල යුතුය. |
| **(ආ)** | සමාලෝචිත වර්ෂයේ එළුවන් ඇතිකිරීමේ ව්‍යාපෘතියේදී දිස්ත්‍රික් ලේකම්වරයාගේ අංක GAT/ PLa.Goat/ DO.02/ 01/01දරන 2023 ජුනි 02 දිනැති ලිපියට අනුව මිලදී ගනුලබන එළුවන්ගේ පිරිවිතරයන් (Specification) ප්‍රකාරව හොඳ සෞඛ්‍ය තත්ත්වයෙන් යුතු එළුවන් තෝරාගත යුතු බවට සඳහන් කර තිබූ නමුත් 2023 සැප්තැම්බර් 23 දින ප්‍රතිලාභීන් 16කට බෙදාහැර තිබූ එකතුව රු.947,118ක් වූ එළුවන් 44ක් | මිලදී ගනු ලබන එළුවන්ගේ පිරිවිතරයන් ප්‍රකාරව හොඳ සෞඛ්‍ය තත්ත්වයෙන් යුතු එළුවන් තෝරාගත යුතු බවට සඳහන් කර තිබූ අතර එළුවන් සඳහා වූ සෞඛ්‍ය තත්ත්ව සහතිකය ලබා ගැනීම ප්‍රමාද වී ඇති බව දන්වා සිටින අතර පශු වෛද්‍යවරයාගේ උපදෙස් පරිදි ප්‍රවාහන කටයුතු කර ඇත. | අවශ්‍ය තත්ත්ව සහතිකයක් නිසි අවස්ථාවේදීම ලබා ගැනීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සැපයුම්කරුගේ ප්‍රදේශයේ සිට තඹලගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ප්‍රවාහනයේදී ලබාගත යුතු 1958 අංක 29 දරන සත්ව ආරක්ෂණ පනත යටතේ එළුවන් සඳහා වූ සෞඛ්‍ය තත්ත්ව සහතිකය (Certificate of Health) ලබා නොගෙන ප්‍රවාහනය කර තිබුණි. | | |
| (ඇ) | 2022/2023 මහකන්නයේ රජයේ වී මිලදී ගැනීම සම්බන්ධයෙන් වූ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ අංක DFD/2023-1 දරන 2023 පෙබරවාරි 09 දිනැති චක්‍රලේඛයේ 2.3.2 ඡේදය අනුව අතැති වී තොග 2023 මාර්තු හා අප්‍රේල් මාස ඇතුළත බෙදාහැරීමට හැකි පරිදි සහල් බවට පත් කර අවසන් කිරීමට කුඩා හා මධ්‍යම වී මෝල් හිමිකරුවන්ගේ ධාරිතාව සැලැකිල්ලට ගෙන වී මිලදී ගැනීමට අවශ්‍ය මුදල් අදාල වී මෝල් හිමිකරුවාට ගෙවිය යුතු බවට සඳහන් කර තිබුණි. එසේ වූවත්, 2023 ඔක්තෝබර් 12 දිනැති විගණන ක්ෂේත්‍ර පරීක්ෂාවේදී පදවි ශ්‍රීපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි එක් වී මෝල් ගබඩාවක එකතුව රු.42,744,000 ක් වූ කිලෝග්‍රෑම් 427,440ක වී තොග පැවතුණි. | අතැති වී තොග 2023 මාර්තු හා අප්‍රේල් මාස ඇතුළත බෙදාහැරීමට හැකි පරිදි සහල් බවට පත් කර අවසන් කිරීමට සැලසුම් කළ ද ඇති වූ අධික වර්ෂා තත්ත්වය නිසා වී තොග සහල් කිරීමේ ගැටළුව නිසා දිමුතු වී මෝල ගබඩාවෙහි වී තොග සැහෙන කාලයක් පැවැති ඇති බව කාරුණිකව දන්වා සිටිමි. | රජයේ සැලසුම් නිසි ආකාරයෙන් ක්‍රියාත්මක කල හැකි වන පරිදි කටයුතු සැලසුම් කල යුතුය. |

## 2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය | | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම | | |
| (අ) | චක්‍රලේඛ අංක 09/2009 හා 2009 අප්‍රේල් 16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 2 | 4,581,676 | අතිකාල හා නිවාඩු දින ගෙවීම් කිරීමේදී ඇඟිලි සළකුණු යන්ත්‍ර මඟින් තහවුරු කිරීම අත්‍යවශ්‍ය වුවත් මොරවැව, පදවි ශ්‍රී පුර, ගෝමරන්කඩවල, | ඇඟිලි සළකුණු යන්ත්‍ර අක්‍රිය පවතින කාල සීමාවන් වලදී මාණ්ලික නිලධාරියකුගේ අධීක්ෂණය යටතේ | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | (iv) ඡේදය | සේරුවිල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිළධාරීන් විසින් එලෙස කටයුතු නොකර සමාලෝචිත වර්ෂය තුලදී අතිකාල හා නිවාඩු දින වැටුප් ලබා ගෙන තිබුණි. | පැමිණීමේ හා පිටවීමේ ලේඛනය පදනම් කරගෙන ගෙවීම් සිදු කර ඇත. | |
| (ආ) | අංක 09/2009 හා 2009 අප්‍රේල් 16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සියළුම රාජ්‍ය නිලධාරීන් විසින් තම පැමිණීම හා පිටවීම ඇඟිලි සලකුණු යන්ත්‍රයක් මඟින් තහවුරු කිරීම අනිවාර්යය වුවත් සේරුවිල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රාදේශීය ලේකම්, සහකාර ප්‍රාදේශීය ලේකම්, ගණකාධිකාරී විසින් 2023 වර්ෂය මුළුල්ලේම සහ ගෝමරන්කඩවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරීන් විසින් 2023 ජනවාරි සිට නොවැම්බර් මස දක්වා ඒ අනුව කටයුතු කර නොතිබුණි. | මින් ඉදිරියට මාර්ගෝපදේශ අනුගමනය කිරීමට කටයුතු කරනු ලැබේ | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 සැලැසුම් කිරීම

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ගිණුම් චක්‍රලේඛ අංක 02/2018 හා 2018 ජනවාරි 29 දිනැති චක්‍රලේඛය අනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් මහජනයා වෙත සපයන සේවා ප්‍රමුඛතා ගත කොට ප්‍රධාන සේවාවන් 5 කට අදාළව ප්‍රශස්ත ඉලක්කයන් තීරණය කර එම ඉලක්ක පිළිබඳ වාර්තාවක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කල යුතුය. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් එම | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල ප්‍රශස්ථ ඉලක්කයන් සාරාංශගත කොට සකස් කරන ලද වාර්තාව විගණකාධිපතිට ඉදිරිපත් කිරීම මගහැරී ඇත. ඉදිරියේදී එසේ ප්‍රමාදයන් වීම වලක්වා ගන්නා බව දන්වමි. | චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | චක්‍රලේඛයේ 2.5 හා 2.6 ඡේදයන්ට අනුව සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල ප්‍රශස්ත ඉලක්කයන් සාරාංශ ගත කොට සකස් කරන ලද වාර්තාවක් විගණකාධිපතිටද පිටපත් සහිතව ස්වදේශ කටයුතු අමාත්‍යාංශය වෙත සෑම වර්ෂයකම ජනවාරි 15 වන දිනට පෙර ඉදිරිපත් කල යුතු වුවත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය 2023 වර්ෂයට අදාළව එම වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. | | |
| (ආ) | 2016 ජුනි 30 දිනට සකස් කරන ලද ත්‍රිකුණාමලය දිස්ත්‍රික් නැවත පදිංචි කිරීමේ සැලැස්මේ ඇතුලත් තොරතුරු අනුව ගෝමරන්කඩවල හා පදවි ශ්‍රී පුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අදාළව යුද්ධය හේතුවෙන් අවතැන් වූ පවුල් ගණන 505 ක් හා නැවත පදිංචි වීමෙන් පසු නිවාස අවශ්‍යතාවය 994 ක් වන අතර රජයේ හා රාජ්‍ය නොවන සංවිධාන මඟින් නිවාස 651 ක් හා අයිතිකරුවන් විසින්ම නිවාස 124 ක් ඉදිකර තිබීම නිසා තවදුරටත් ඉදිකිරීමට අවශ්‍ය නිවාස සංඛ්‍යාව 219 ක් විය. 2016, 2017, 2019 හා 2020 යන වර්ෂවල රජය විසින් ක්‍රියාත්මක කල නිවාස ව්‍යාපෘති මඟින් නිවාස 283 ක් ඉදිකර තිබීම හේතුවෙන් 2020 වර්ෂය වන විටත් නිවාස අවශ්‍යතාවය ඉක්මවා නිවාස 64 ක් ඉදිකර තිබුණි. 2021 වර්ෂයේදීද එලෙස අවතැන් වූවන් ලෙස හඳුනා ගනිමින් නිවාස 89 ක් සඳහා අනුමත කිරීම මඟින් නැවත පදිංචි කිරීමේ සැලැස්මේ ඇතුලත් නිවාස අවශ්‍යතාවය ඉක්මවා නිවාස 153 ක් ඉදිකර තිබියදීත්, 2023 වර්ෂයේදී නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය යටතේ ගෝමරන්කඩවල හා පදවි ශ්‍රී පුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සඳහා නිවාස 23ක් ලබාදී තිබුණි. | කොට්ඨාසය අතහැර ගිය පුද්ගලයින් නැවත පදිංචියට පැමිණීම සඳහා විවිධ අවස්ථා වල ඉල්ලීම් කරයි. එම පවුල්වල අනු පවුල් තොරතුරු නිශ්චිත නොවේ. ඒ අනුව තවදුරටත් සැලැස්මේ සඳහන් තොරතුරු ඉක්මවා යාමේ හැකියාවක් පවතින බැවින් 2021 වර්ෂයේ දී සියළුම ග්‍රාම නිලධාරි වසම් ආවරණය වන පරිදි සුදුසු ප්‍රතිලාභීන් තෝරා ප්‍රමුඛතා ගත කර ඉදිරිපත් කරන ලදි. ඒ අනුව 2023 වර්ෂයේ දී අඩු ආදායම්ලාභී ප්‍රතිලාභීන් 08 දෙනෙකුගෙන් හා නැවත පදිංචි කරන ලද ප්‍රතිලාභීන් 05 දෙනෙකුගෙන් සමන්විත ප්‍රතිලාභී නාම ලේඛනයක් අනුමත කර නිවාස ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍යශංය විසින් අප වෙත එවන ලදි. | නැගෙනහිර පළාත් ප්‍රධාන ලේකම් හා ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම්ගේ ත්‍රිකුණාමලය දිස්ත්‍රික් නැවත පදිංචි කිරීමේ සැලැස්ම යාවත්කාලීන කොට නිවැරදි තොරතුරු තහවුරු කර ගත යුතුය |

### 3.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වෙරුගල් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත 2023 සැප්තැම්බර් 07 දින නිකුත් කල යුද්ධයෙන් අවතැන්වූ ජනතාවට ස්ථිර නිවාස ඉදිකිරිමේ ව්‍යාපෘතිය - 2021 ප්‍රගති වාර්තාවට අනුව රුපියල් මිලියනයක් වටිනා නිවාස 07ක් භෞතික වශයෙන් මුළුමනින්ම නිම කර ඇති බවට වාර්තා කර තිබූ නමුත් 2023 නොවැම්බර් 10 දිනැති විගණන පරීක්ෂාවේදී එකතුව රු.425,000ක් වූ මුදලක්, කාර්යයන් ඉටුනොකර අදාල ප්‍රතිලාභීන්ගේ සමෘද්ධි බැංකු ගිණුමේ තැන්පත් කර තිබුණි. | යුද්ධයෙන් අවතැන්වූ ජනතාවට ස්ථිර නිවාස ඉදිකිරිමේ ව්‍යාපෘතිය-2021 යටතේ රජයේ මුදලින් නිම කළ යුතු කොටස් සම්පූර්ණ කර ඇත. භෞතික වශයෙන් මුළුමනින්ම නිම කර නොමැති නිවාස හිමිකරුවන් වෙත වැඩ නිමකරන තෙක් මුදල් මුදා නොහැරිම එසේ රඳවාගෙන තිබීමට හේතු වී ඇත. ඇතැම් ප්‍රතිලාභීන් පිටරට ගොස් සිටීමත් නිසා අදාල ප්‍රතිලාභීන්ගේ මුදල් සමෘද්ධි බැංකු ගිණුමේ තැන්පත් කර ඇත. | ව්‍යාපෘති ප්‍රගති වාර්තාව සත්‍ය තොරතුරු මත පදනම්ව ඉදිරිපත් කල යුතුය. |

### 3.3 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වෙරුගල් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2021 වර්ෂයේදී යුද්ධයෙන් අවතැන්වූ ජනතාව වෙනුවෙන් ස්ථිර නිවාස ඉදිකිරීම් ව්‍යාපෘතිය සඳහා වූ අංක SMRHC/RD/04/01 දරන ලිපියේ 4.4 ඡේදය ප්‍රකාරව වටිනාකම රු.600,000ක් බැගින් වූ නිවාස 15ක් ඉදිකිරීමට එකතුව රුපියල් මිලියන 8.96ක මුළු මුදලම ප්‍රතිලාභීන්ගේ බැංකු ගිණුම්වලට අදියර හතරකින් 2021 වර්ෂයේ තැන්පත් කර තිබූ නමුත් 2023 නොවැම්බර් 10 දින සිදුකළ විගණන පරීක්ෂාවේදි එකතුව රු. මිලියන 1.227 ක් ප්‍රතිලාභීන් 15කගේ සමෘද්ධි බැංකු ගිණුම්වල තැන්පත් කර තිබුණි. | අදහස් දක්වා නෙතිබුණි. | ව්‍යාපෘතිවල අපේක්ෂිත නිමැවුම් මට්ටම එලෙසින්ම ලගාකර ගැනීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2021 වර්ෂය තුළදී නිම කිරීමට අපේක්ෂිත නිවාස ව්‍යාපෘතිය මොරවැව, පදවි ශ්‍රී පුර, ගෝමරන්කඩවල, සේරුවිල, කන්තලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නියමිත කාලයේදී අවසන් කිරීමට කටයුතු කර නොතිබුණු අතර 2023 දෙසැම්බර් 31 දින වන විටත් රු. මිලියන 01 නිවාස 83ක් හා රු.600,000යේ නිවාස 74ක වැඩකටයුතු සම්පූර්ණයෙන් අවසන් කිරීමට නොහැකි වී තිබුණි. | අක්මුදල් ලැබීම ප්‍රමාද වීම හේතුවෙන් ව්‍යාපෘතිය අවසන් කිරීමට නොහැකි විය. ඉදිකිරිමවල භෞතික ප්‍රගතිය සහතික කළ පසු ගෙවීම් සිදු කර ඇත. ඇතුම් ඉදිකිරීම් සම්පූර්ණ කරන තුරු මුදල බැංකුවේ රඳවාගෙන ඇත. | නිවාසවල වැඩකටයුතු සම්පූර්ණ කිරීමට කටයුතු කල යුතුය. |
| (ඇ) | 2021 වර්ෂයේ නිවාස ඉදිකිරීමට අදාළ ප්‍රගතිය දැක්වෙන වාර්තා අනුව සේරුවිල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ රු.600,000යේ නිවාස වැඩසටහනෙහි ප්‍රතිලාභීන් 30ක් හා රු. මිලියනයේ වැඩසටහනෙහි ප්‍රතිලාභීන් 32 ක් සම්පූර්ණයෙන්ම නිවාස ඉදිකර අවසන් බවට දක්වා තිබුණද, මෙම නිවාස වැඩසටහනේ ප්‍රතිලාභීන් 44 කගේ මූල්‍යාධාර එකතු වටිනාකම රු.2,308,000ක් 2023 දෙසැම්බර් 31 දින වන විට සමෘද්ධි බැංකු ගිණුමේ රඳවා තබාගෙන සිටීම හේතුවෙන් ඔවුන්ගේ නිවාසවල වැඩ සම්පූර්ණ කිරීමේ ප්‍රගතිය සම්බන්ධයෙන් විගණනය වෙත ඉදිරිපත් කල වාර්තාවන් සමඟ නිවාස වල භෞතික ප්‍රගතිය එකඟ නොවීය. | සේරුවිල - 2023 අවසන් කාර්තුවේ ප්‍රතිපාදන ලැබී ඇති අතර, එම නිසා ව්‍යාපෘතිය නිම කිරීමට ගත වූ කාලය ප්‍රමාණවත් නොවීය. කන්තලේ - නිවාස සම්පූර්ණ කිරීමට කාලය ප්‍රමාණවත් නොවූ අතර ලැබෙන අක්මුදල් පරිදි නිම කරනු ලැබේ . | මූල්‍ය ප්‍රගතිය හා භෞතික ප්‍රගතිය චක්‍රලේඛයට අනුකූලව ගැලපිය යුතුය. |
| (ඈ) | මොරවැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය 2021 වර්ෂයේ නිවාස ව්‍යාපෘතියේ රු.600,00 ක නිවාස 30 හා රුපියල් මිලියනයේ නිවාස 31ට අදාළව අවසන් වාරික මුදල් එකතු වටිනාකම ලෙස පිළිවෙලින් රු.2,909,250ක් හා රු.2,149,225ක් 2022 වර්ෂයේදී අවස්ථා හතරකදී මොරවැව සමෘද්ධි බැංකුව වෙත යවා තිබුණි. මෙම නිවාසවල ප්‍රගතිය අනුව රු.600,000 නිවාස 16 ක හා රු. මිලියනයේ නිවාස 21 ක භෞතික වැඩ අසම්පූර්ණව තිබූ අතර ශේෂ වශයෙන් රු. මිලියනයේ නිවාස වැඩසටහනේ ප්‍රතිලාභීන් 22කගේ රු.3,365,000 ක්ද, රු.600,000 නිවාස වැඩසටහනේ ප්‍රතිලාභීන් 14කගේ රු.1,293,000 ක්ද වශයෙන් වසර දෙකකට ආසන්න කාලයක් රඳවා තබා ගෙන තිබුණි. | 2021 වර්ෂයේ නිවාස ව්‍යාපෘතියේ නිවාසවල ඉදිකිරීම් ප්‍රගතිය අනුව භෞතික වැඩ සම්පූර්ණව තිබූ නිවාස වලට ගෙවීම් කර ඇත. ඇතැම් සුළු අඩුපාඩු සම්පූර්ණ කරන තෙක් සමෘද්ධි බැංකුවේ රඳවා තබා ගෙන ඇත. ඇතැම් ප්‍රතිලාභීන් පිටරට යාම වැනි අවස්ථාවල ඉදිකිරීම් නිමවා තිබුණ ද මුදල් නිදහස් කිරීමේ ප්‍රමාදයක් සිදුව ඇත. | වැඩ අවසන් නොකරන ලද නිවාසවල ඉක්මනින් වැඩ අවසන් කිරීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ අංක MOUD&H/RD/04 /01 හා 2023 අප්‍රේල් 27 දිනැති චක්‍රලේඛයේ 4.3.5 වගන්තිය අනුව 2023 නිවාස ව්‍යාපෘතිය 2023 නොවැම්බර් 30 දිනට පෙර සම්පූර්ණ කළ යුතු වුවත් මොරවැව, පදවි ශ්‍රී පුර, ගෝමරන්කඩවල, සේරුවිල, කන්තලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් එසේ කටයුතු කර නොතිබුණු අතර 2023 දෙසැම්බර් 31 දිනට රු. මිලියනයේ නිවාස 41ක සහ රු.600,000 නිවාස 33ක වැඩකටයුතු අවසන් කර නොතිබුණි. | 2023 නිවාස ව්‍යාපෘතිය 2023 නොවැම්බර් 30 දිනට පෙර සම්පූර්ණ කළ යුතු වුවත් ප්‍රතිපාදන ලැබීම ප්‍රමාද වීම හා ප්‍රතිපාදන ලැබීමෙන් පසු ව්‍යාපෘතිය නිම කිරීමට ඉතිරිව තිබූ කාලය තුල සම්පූර්ණ කිරීමේ අපහසුතාවක් සිදු වී ඇති බව කාරුණිව දන්වමි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාර වැඩ අවසන් කිරීමට කටයුතු කල යුතුය. |

## 3.4 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ග්‍රාමීය මාර්ග හා යටිතල පහසුකම් ව්‍යාපෘතිය 2021 යටතේ (RRDP) මාර්ග 69ක් ඉදිකිරීම සඳහා එකතුව රු. මිලියන 99ක ප්‍රතිපාදන වෙන්කර වෙරුගල් සහ මූතූර් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට ලබාදී තිබූ අතර, ඉදිකිරීම් සඳහා එකතුව රු. මිලියන 21.98ක් කොන්ත්‍රාත්කරුවන්ට ගෙවීම් කර මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොකර අත්හැර දමා තිබුණි. | ග්‍රාමීය මාර්ග හා යටිතල පහසුකම් ව්‍යාපෘතිය යටතේ මාර්ග 69ක් ඉදිකිරීම ප්‍රතිපාදන ලැබී මාස දෙකක් වැනි කෙටි කලකින් වෙරුගල් සහ මූතූර් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ලියාපදිංචි ගම්සභා කොන්ත්‍රාත්කරුවන්ට නොහැකි කාර්යයක් ව තිබීම නිසා ව්‍යාපෘති ප්‍රමාද වී ඇති බව කාරුණිකව දන්වා සිටිමි. | ව්‍යාපෘතිවල ප්‍රතිපාදන ප්‍රශස්ථව භාවිතා කල යුතුය. |

## 3.5 ප්‍රසම්පාදනයන්

.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.11 අනුව යම් කොන්ත්‍රාත් කාර්යයකට අදාල එකතු කළ අගය මත බදු මුදල, එම එකතු කළ අගය මත බදු ඉන්වොයිසිය (VAT Invoice) ලබාගැනීමෙන් පසුව පමණක් අදාල කොන්ත්‍රාත්කරු වෙත ගෙවිය යුතු වුවත්, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් එකතු කළ අගය මත බදු මුදලට අදාල ඉන්වොයිසිය | අතපසුවීමක් සිදුව ඇති බව කාරුණිව දන්වා සිටිමි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ මාර්ගෝපදේශ අනුව කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ලබානොගෙන දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් තඹලගමුව සමෘද්ධි බැංකුවේ නව බැංකු ගොඩනැගිල්ල ඉදිකිරීම වෙනුවෙන් එකතුව රු.284,846 ක්වූ එකතු කළ අගය මත බදු මුදල් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි. | | |
| (ආ) | මොරවැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නව ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා සම්පූර්ණ පිරිවැය ඇස්තමේන්තුව (TCE) රු. මිලියන 11 ක් වූ අතර, රු. මිලියන 2.5, රු. මිලියන 5 සහ රු. මිලියන 3.5 ක් වූ අදියර තුනකින් ඍජු කොන්ත්‍රාත් ක්‍රමයට අනුව ඉදිකිරීමට සැලසුම් කලද මෙම කොන්ත්‍රාත්තුවේ පැකේජ් කිරීම අවිධිමත් සහ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ යොමු අංක 4.4 හි විධිවිධානවලට පටහැනිව සිදු කර තිබුණි. ඍජු කොන්ත්‍රාත්තු සඳහා ප්‍රසම්පාදන සීමාව රුපියල් මිලියන 05ක් වූ බැවින් මෙසේ කොන්ත්‍රාත්තුව අදියර වලට වෙන් කර ක්‍රියාත්මක කර තිබුණි. | මොරවැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගොඩනැගිල්ල දිගු කිරීමේ ඉදිකිරීම සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන සලසා ගැනීමට නොහැකි වූ බැවින් කොටස් කොටස් වශයෙන් අරමුදල් සොයා ගැනීමට සිදු විය. එබැවින් අදියර ලෙස ගොඩනැගිල්ල දිගු කිරීම සිදු කර ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ මාර්ගෝපදේශ අනුව කටයුතු කල යුතුය. |

**3.6 වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය ලේකම් නිලනිවාස 02 ද ඇතුළත්ව නිල නිවාස 07ක් සේරුවිල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත්ව පැවතියද නිල නිවාස 02 ක පමණක් පදිංචිව සිටින බව නිරීක්ෂණය වූ අතර එම පදිංචිව සිටින නිල නිවාස 02 ද අළුත්වැඩියා කලයුතු තත්ත්වයේ පවතින බැවින් පවත්නා වත්කම්වල ප්‍රශස්ථ උපයෝජනය ලබා ගත නොහැකි මට්ටමක පවතී. ඒ අනුව පැරණි ප්‍රාදේශීය ලේකම් නිලනිවස, සෝමපුර සංචාරක බංගලාව සහ වසර 42ක් ඉක්මවා ඇති පොදු නිලනිවාස 05ම අළුත්වැඩියා කළ යුතු තත්ත්වයේ පැවතුණි. | සේරුවිල - වරින් වර ප්‍රතිපාදන ඉල්ලා ඇති අතර, අංක 02 දරන නිල නිවාසයේ අලුත්වැඩියා කටයුතු සඳහා පමණක් ප්‍රතිපාදන ලැබී ඇත. | වත්කම් ප්‍රශස්ථ ලෙස උපයෝජනය කල යුතුය. |
| (ආ) | ගෝමරන්කඩවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් 233A කිව්ලකඩවල ග්‍රාම නිලධාරී වසමේ පදිංචිකරුවන් සඳහා 2016, 2017 හා 2019 යන වර්ෂවලදී ලබා දී තිබූ නිවාසවල පදිංචි නොවූ ප්‍රතිලාභී පවුල් 07 ක්ද, | නිවාස ප්‍රතිලාභී පවුල් 04 ක්ද හා පදිංචිය හැරගිය නිවාස ප්‍රතිලාභී පවුල් 02 ක්ද වූයෙන් රජය මඟින් ප්‍රතිපාදන ලබා දී ඉදිකර තිබූ | අවශ්‍යතා ඇති ප්‍රතිලාභීන් පමණක් හඳුනාගෙන නිවාස ලබදීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | නිවාසවල රැඳී නොසිට කලාතුරකින් දහවල් කාලයේ යාම ඒම සිදුකරන නිවාස ප්‍රතිලාභී පවුල් 04 ක්ද හා පදිංචිය හැරගිය නිවාස ප්‍රතිලාභී පවුල් 02 ක්ද වූයෙන් රජය මඟින් ප්‍රතිපාදන ලබා දී ඉදිකර තිබූ එම නිවාස සත්‍ය වශයෙන්ම නිවාස අවශ්‍යතාවය පවතින පුද්ගලයින්ට හිමි වී නොතිබුණි. | එම නිවාස සත්‍ය වශයෙන්ම නිවාස අවශ්‍යතාවය පවතින පුද්ගලයින්ට හිමි වී නොතිබුණි. | |

## 3.7 කළමනාකරණ දුර්වලතා

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සේරුවිල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතුව ප්‍රාදේශීය ලේකම් සඳහා උපලේඛනගත නිලනිවාස 02ක් පවතින අතර ඉන් එකක් 2018 වර්ෂයේ ඉදිකර දැනට සමෘද්ධි කාර්යාලය පවත්වාගෙන යනු ලබයි. අනෙක් නිල නිවාසය දැනට අබලන් තත්වයේ පවතින බව හා එම නිලනිවස අළුත්වැඩියා කර භාවිතයට ගත හැකි තත්ත්වයේ පවතින අතර ප්‍රාදේශීය ලේකම්වරයා එම නිලනිවාසයේ පදිංචි වී නොතිබුණි. | සමෘද්ධි ගොඩනැගිල්ල කඩා වැටී ඇති නිසා සමෘද්ධි කාර්යාලය පවත්වාගෙන යනු ලබන්නේ ප්‍රාදේශීය ලේකම් නිලනිවාසයේය. එබැවින්, ප්‍රාදේශීය ලේකම් නිල නිවසේ පදිංචි ව නැත. නිවසේ සිට රාජකාරියට වාර්තා කිරීමට අවසර ඉල්ලා ඇති අතර නිවසේ සිට පැමිණ අවශ්‍ය සියලුම රාජකාරි ආවරණය කර ඇත. | උපලේඛන ගත නිවාස උපරිම ආකාරයට උපයෝජනය කිරීමට කටයුතු කල යුතුය. |
| (ආ) | සේරුවිල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් උපලේඛනගත නොවන අනෙකුත් නිලනිවාස 05 හා සෝමපුර සංචාරක බංගලාවේ ඉඩම් සහ ගොඩනැගිලිවල අයිතිය සේරුවිල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතු නොවන අතර එම ඉඩම් සහ ගොඩනැගිලිවල අයිතිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත පවරා ගැනීමට විගණිත දිනය වූ 2024 පෙබරවාරි 08 දින වන විටත් කටයුතු කර නොතිබුණි. | නිවාසවල අයිතිය ස්වදේශ කටයුතු අමාත්‍යාංශයට පවරා ඇති බවට ජාතික නිවාස සංවර්ධන අධිකාරිය අප වෙත දන්වා සිටියද ඒ සඳහා අවශ්‍ය ලිපි ලේඛන මෙම කාර්යාලයට ලැබී නොමැත. ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ. | ඉඩමේ අයිතිය නිරවුල්ව පවරා ගැනීමට කටයුතු කල යුතුය. |
| (ඇ) | ත්‍රිකුණාමලය නගර හා කඩවත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කළමනාකරණ සහකාර සේවයේ III ශ්‍රේණියේ සේවය කල නිලධාරිනියක් විසින් ව්‍යාජ විභාග ප්‍රතිඵල ඉදිරිපත් කර 2015 සැප්තැම්බර් 15 දින සිට 2022 දෙසැම්බර් 31 දින දක්වා වැටුප් හා දීමනා වශයෙන් රු.3,305,197 ක් ලබාගෙන තිබුණි. | **i**.විභාග ප්‍රතිඵල ව්‍යාජ බව සනාථ වීමෙන් පසුව ඇයගේ සේවය අත්හිටුවා ඇත. | සුදුසුකම් පරීක්ෂා නොකර නිලධාරීන් බඳවා ගැනීම පිළිබඳ වගකිව යුතු නිලධාරීන්<br><br>සම්බන්ධයෙන් හා |

| | | | |
|---|---|---|---|
| | ඊට අමතරව ලබාගෙන තිබූ ආපදා ණයවල 2022 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ශේෂය රු.205,650 ක්වූ අතර 2015 ඔක්තෝබර් 14 දින සිට 2016 පෙබරවාරි 25 දින දක්වා සම්පූර්ණ වැටුප් සහිතව ප්‍රසූත නිවාඩු හා 2019 අගෝස්තු 27 දින සිට 2019 සැප්තැම්බර් 05 දින දක්වා දින 10ක් දිවයිනෙන් බැහැර නිවාඩුද ලබාගෙන තිබුණි. | **ii**. ආපදා ණය ලෙස රජයට අය විය යුතු රු.205,650.00 ක මුදල ඇගේ ඇපකරු වෙතින් වාරික වශයෙන් අයකර ගනු ලැබේ.<br><br>**iii**. 2015-2021 දක්වා කාලය තුල පුද්ගලික ලිපි ගොනු සම්බන්ධව කටයුතු කළ නිලධාරීන්ගෙන් අදාල ප්‍රමාදයට හේතු විමසා ඇත.<br><br>**iv.** වැටුප් හා දීමනා ලෙස ගෙවා ඇති රු.3,305,197 ක මුදල 2024-05-21 දිනට ප්‍රථම රජයට ගෙවන ලෙස නිලධාරිනියට දන්වා ඇත. | මේ හේතුවෙන් රජයට සිදුවූ අලාභය පියවා ගැනීම සම්බන්ධයෙන් වහාම ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) | 2019/2020 මහ කන්නයේ වී මිලදී ගැනීමේ කඩිනම් වැඩපිළිවෙල යටතේ කන්තලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සහල් මෝල් හිමිකරුවන් 04 දෙනෙකුගෙන් සහ ලංකා සතොස ආයතනයෙන් ලැබිය යුතු එකතු වටිනාකම රු.6,490,269ක් වූ සහල් කිලෝග්‍රෑම් 77,146කට අදාල මුදල් වර්ෂ 03ක කාලයක් ඉක්ම ගියද දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් අයකරගෙන නොතිබුණි. | නීතිමය පියවරක් ලෙස කන්තලේ පොලිසියට පැමිණිල්ලක් යොමු කර ඇත. මෙම ගැටළුව තුල සාපරාධී වරදක සලකුණු නොමැති බව කන්තලේ පොලිසිය දන්වා ඇති බැවින් නීතිපතිවරයාගෙන් වැඩිදුර උපදෙස් ඉල්ලා ඇත. | අදාල මුදල් කඩිනමින් අය කර ගැනීමට කටයුතු කල යුතුය. |

**4. තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තිරසාර ඉලක්කයන් පිළිබඳ නිලධාරින් ප්‍රමාණවත් පරිදි දැනුවත් වී නොතිබුණු අතර තිරසාර සංවර්ධන ඉලක්කයන් හඳුනා ගැනීම සිදුවී නොමැති නිසා සමාලෝචිත වර්ෂයේ ඇගයීමක් සිදු කර නොතිබුණි. | තිරසර සංවර්ධන සැලැස්මක් සකස් කර දෙන ලෙසට ඉල්ලීමක් තිරසර සංවර්ධන කවුන්සිලයේ අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කර ඇත. | තිරසාර සංවර්ධන ඉලක්කයන් හඳුනා ගැනීමට හා ක්‍රියාත්මක කිරීමට කටයුතු කල යුතුය. |

**5.** **මානව සම්පත් කළමණාකරණය**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසාන වන විට ජ්‍යෙෂ්ඨ මට්ටමට අයත් නිලධාරි තනතුරු පුරප්පාඩු 15 ක්ද තෘතික මට්ටමට අයත් නිළධාරි තනතුරු පුරප්පාඩු 24 ක්ද ද්විතික මට්ටමට අයත් නිළධාරි තනතුරු පුරප්පාඩු 39 ක් හා ප්‍රාථමික මට්ටමට අයත් නිළධාරි තනතුරු පුරප්පාඩු 37 ක්ද වශයෙන් මුළු පුරප්පාඩු ප්‍රමාණය 115 ක්ව පැවතුණි. | පුරප්පාඩු පිරවීම සඳහා පුරප්පාඩු පිළිබඳ වාර්තාව සමඟ සේවක සංඛ්‍යාව මාසිකව යාවත්කාලීන කර ස්වදේශ කටයුතු අමාත්‍යාංශයට සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යවා ඇත. සමහර තනතුරු පුරවා ඇත්තේ අපගේ ඉල්ලීම් පරිදිය. | අත්‍යාවශ්‍ය තනතුරු පුරප්පාඩු පිරවීමට කඩිනමින් කටයුතු කල යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුලදී දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවා කාලය වර්ෂ 05 ක් ඉක්මවා සිටින නිලධාරීන් 455 දෙනෙකු සම්බන්ධයෙන් ස්ථාන මාරු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කර නොතිබුණි. | වාර්ෂික ස්ථානමාරු යෝජනා ක්‍රමය යටතේ බොහෝ නිලධාරීන් ස්ථාන මාරුවීම් ලබා ඇත. විශේෂ අවධානය යොමු කළ යුතු නිලධාරීන්ගේ සමහර ඉල්ලීම් කාර්යාල කටයුතුවලට අවම අවාසි සහගත ලෙස සලකා බලා ඇත. | 2001 අගෝස්තු 22 දිනැති අංක 18/2001 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතුය. |